# මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ 2022.08.15 දින පැවති මහා සභාවේ වාර්තාවයි.

2022.08.15 වන දින පෙ.ව 09.30 ට පමණ ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලි මැතිතුමියගේ ප්‍රධානත්වයෙන් සභා කටයුතු ආරම්භ කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

අද දින සභා රැස්වීම සඳහා පැමිණ සිටින ඔබ සියලුම දෙනා ඉතාමත් ආදරයෙන් පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව අද දින සභා කටයුතු ආරම්භ කර සිටින අතර මීළඟට පසුගිය සභාවේ වාර්තාව සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.

**ගරු උප සභාපති පී.පී.ප්‍රදීපන් මැතිතුමා (ලං.ක.කො)**

පසුගිය සභා වාරයේ සභා වාර්තාව නිවැරදි බවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**

එම යෝජනාව මා ස්ථිර කරමි.

**තීරණ අංක 01**

2022.07.12 සභා වාර්තාව නිවැරදි බවට සභාව විසින් අනුමත කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**

මාගේ විශේෂ කතාවේදී, නල්ලතන්නිය ප්‍රධාන මාර්ගයේ, ලක්ෂපාන වතුයායේ, වාලමලේ ප්‍රදේශයේ අධික වර්ෂාපතනය හේතුවෙන් මාර්ගය දැඩි අවධානම් තත්වයක පවතින හෙයින් එම ප්‍රදේශයේ ජනතාව විසින් මාර්ගය භාවිතා කළ නොහැකි තත්වයක පවතිනවා. මේ පිළිබඳව නුවරඑළිය දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජීවන් තොන්ඩමන් මැතිතුමා ද, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාමේෂ්වරන් මැතිතුමා ද එක්ව මාර්ග සංවර්ධන අධිකාරිය, දිස්ත්‍රික් ලේකම්තුමා, භූ විද්‍යා පර්යේෂණ නිලධාරීන් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව එම ස්ථානයට පැමිණ පරීක්ෂා කළ අතර එකී නිළධාරීන් ද එම අවස්ථාවේ පැමිණ සිටියා. දැනට එම මාර්ගය භාවිතා කිරීම අනතුරුදායක බව ප්‍රකාශ කළ අතර හැකි ඉක්මනින් එම මාර්ගය යථා තත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරන බවට ප්‍රකාශ කරනු ලැබුවා. තවද ලක්ෂපාන ප්‍රදේශයේ පිහිටි බෝ ගසක් ජනතාවට අනතුරුදායක තත්වයෙන් පිහිටා තිබීම නිසා එම ස්ථානයට පැමිණි නුවරඑලිය දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජීවන් තොණ්ඩමන් මැතිතුමාද, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාමේෂ්වරන් මැතිතුමාද ස්ථාන පරීක්ෂණයක් සිදුකර එම ස්ථානයේ සිට සාකච්ඡා කිරීමෙන් අනතුරුව දැනට එම ගසේ අතු කපා ඉවත් කර තිබෙනවා. කඩිනමින් එම ගස කපා ඉවත් කරන බවට ද පැවසුවා. මේ පිළිබඳව එම කොට්ඨාශයේ ගරු මන්ත්‍රීවරුන් ජනතාවට පැහැදිලි කිරීමක් කරන ලෙස ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**

ලක්ෂපාන ප්‍රදේශයේ සිදුව ඇති නාය යෑම එම ප්‍රදේශයේ ජනතාවට විශාල ප්‍රශ්නයක් වී තිබෙනවා. නල්ලතන්නිය මරේ ඉතා වැදගත් ප්‍රදේශ. එම මාර්ගය ඔස්සේ බර වාහන ගමන් කරමින් තිබුණා. දැනට එම මාර්ගය වසා ඇති නිසා වාලමලේ හරහා පොඩි වාහන පමණක් ගමන් කරනවා. එම මාර්ගයත් ඉතා අබලන් තත්වයෙනුයි පවතින්නේ. එම මාර්ගයේ පිහිටි පාලම ද ඉතා අබලන් තත්වයෙන් පවතිනවා. එම පාලමත් කඩා වැටුනහොත් එම ප්‍රදේශය සඳහා වූ සියලුම ගමන් මාර්ග නැති වී යනවා. එනිසා මෙම මාර්ගය මහාමාර්ග දෙපාර්තමේන්තුව විසින් අළුත්වැඩියා කළ යුතුයි. මෙම තත්වය මත එම ප්‍රදේශ සඳහා

ධාවනය වන වාහන වල අයකිරීම නියමිත ප්‍රමාණයක නැහැ. එනිසා ජනතාව විශාල අසීරුතාවයකට පත්ව සිටිනවා. මෙය ශ්‍රී පාද වන්දනා සමයක සිදු වූවා නම් මෙම මාර්ගය වහාම ප්‍රතිසංස්කරණය කරනු ලබයි. දැනට වර්ෂාව හේතුවක් බවට පවසා තිබෙනවා. නමුත් දැනට වර්ෂාව නැහැ. වියළි කාළගුණයක් පවතිනවා. මේ පිළිබඳ පැහැදිලි කිරීමක් නැහැ. එනිසා ජනතාවට මේ සඳහා ස්ථිර විසඳුමක් ලබා දෙන්න.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
ගරු සභාපති තුමිය, ඔබතුමියගේ විශේෂ යෝජනාවේදී සීතගඟුල ප්‍රදේශයේ ඇති වූ නාය යෑම පිළිබඳව සඳහන් කර තිබුණා. මේ පිළිබඳව හිටපු ගරු ආණ්ඩුකාර කීර්ති තෙන්නකෝන් මැතිතුමා සමග සංවිධානය කරන ලද සාකච්ඡාවකදී මම නල්ලතන්නිය මාර්ගය පිළිබඳව කරුණු ඉදිරිපත් කළා. එදින සාකච්ඡාවේදී එය ප්‍රශ්නාර්ථයක් බවට පත් වුණා. අවුරුදු දෙකකට පෙර මෙම කාරණාව පිළිබඳව දිගටම මම සභාවට කරුණු ඉදිරිපත් කර තිබෙනවා. හිටපු ගරු රාධාක්‍රිෂ්ණන් මැතිතුමා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙහි සිටින අවස්ථාවේදී පවා මෙම කාරණාව පිළිබඳව කථා කර තිබෙනවා. එහිදී ද මේ සඳහා විධිමත් තීරණයකට එළඹීමට අපොහොසත් වුණා. එතැන විකල්ප ක්‍රියාමාර්ගයක් ලබා ගැනීම සඳහා අද දින පැමිණෙන බවට පවසා තිබෙනවා. එසේ පැමිණියහොත් එය ප්‍රයෝජනවත් වේවි.

**<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)</u>**
මාර්ග සම්බන්ධව කතා කරන විට මාර්ග බොහොමයක් අබලන්ව වලවල් සෑදී තිබෙනවා. මෙම මාර්ග පිළිසකර කිරීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට පවසා එමගින් හෝ විකල්පයක් සඳහා නොයන්නේ නම් මෙම වලවල් තවත් විශාල වනු ඇත. රජයද දැනට පවතින තත්වයත් සමඟ මේවා පරීක්ෂා කිරීම සඳහා නොපැමිණෙන නිසා විකල්පයක් සඳහා ගියහොත් මෙය වලක්වා ගත හැකියි. මේ සම්බන්ධව එම නිලධාරී මහතුන් සමඟ සාකච්ඡා කරන්න.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු මන්ත්‍රීවරුන් පවසන පරිදි මස්කෙළිය ප්‍රදේශයේ මාර්ග ගැටළු වැඩි වෙමින් පවතිනවා. මේ නිසා අනතුරු වැඩිවීමේ අවධානමක් ද පවතිනවා. ගරු සභාපතිතුමියටත් මේ පිළිබඳව මා පවසා තිබෙනවා. මුදල් කමිටුවේ දී මෙම කාරණාව පිළිබඳව සාකච්ඡා කළාද කියා මා දන්නේ නැහැ. එනිසා මේ පිළිබඳව අවශ්‍ය කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මීළඟට සභාවට ලැබී ඇති ලිපි සහ පැමිණිලි සභාවට ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිමි.

**ලිපි අංක 01**
යොමු කරන්නා - ගරු මන්ත්‍රී කේ. එල්. රංජනි මැතිණිය, මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
විෂය - 2022.08.15 දින සභා රැස්වීම සඳහා පැමිණීමට නොහැකි බව දන්වන ලද නිවාඩු ලිපිය.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
ගරු මන්ත්‍රී තුමියගේ නිවාඩු ලිපිය පිළිබඳ යෝජනාව මා ඉදිරිපත් කරමි.

**<u>ගරු මන්ත්‍රී එස්.ඒ.දිසානායක මැතිතුමා (ශ්‍රී ලං.පො.පෙ)</u>**
එම යෝජනාව මා ස්ථිර කරමි.

**තීරණ අංක 02**
ගරු මන්ත්‍රී කේ. එල්. රංජනී මැතිණියගේ නිවාඩුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**ලිපි අංක 02**
යොමු කරන්නා - පළාත් පාලන දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත් සභාව.
විෂය - රජයේ ආයතනවල උත්සව සහ වෙනත් කැදවීම් සඳහා රජයේ මුදල් භාවිතා කිරීම අත්හිටුවන ලෙසට දැනුම් දෙන ලද ලිපිය.

**ලිපි අංක 03**
යොමු කරන්නා - පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය.
විෂය - 2022.05.13 දිනැති සභා වාර්තාව පිළිබඳ නිරීක්ෂණ ලිපිය.

**ලිපි අංක 04**
යොමු කරන්නා - පළාත් පාලන දෙපාර්තමේන්තුව, මධ්‍යම පළාත් සභාව.
විෂය - ගරු මන්ත්‍රීවරුන් සඳහා මන්ත්‍රී හැදුනුම්පත් ලබා දීම සම්බන්ධ ලිපිය.

**ලිපි අංක 05**
යොමු කරන්නා - පුස්තකාලය භාර නිලධාරී, මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
විෂය - පුස්තකාල පාඨකයන් සඳහා ස්වයං රැකියා පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් දියත් කිරීම පිළිබඳ ලිපිය.

**ලිපි අංක 06**
යොමු කරන්නා - විෂය භාරකරු, මස්කෙළිය ප්‍රාදේශීය සභාව.
විෂය - කොවිඩ් 19 වසංගත කාලයේ ඇදිරිනීතිය ක්‍රියාත්මක වීම හේතුවෙන් ටෙන්ඩර්කරුවන්ට සිදුවූ පාඩුව සඳහා සහනයක් ලබාදීම සම්බන්ධ ලිපිය.

**තීරණ අංක 03**
කොවිඩ් 19 වසංගතය හේතුවෙන් 2021 වර්ෂයේදී සියළුම ටෙන්ඩර්කරුවන් සඳහා ටෙන්ඩර් මුදලින් 10% ක මුදල වන රු.618310.00 ක මුදල සඳහා සහනයක් ලබාදීමට සභාවේ ඒකමතිකව තීරණය කරන ලදී.

**ලිපි අංක 07**
යොමු කරන්නා - මහ ජනතාව, ප්‍රධාන වීදිය, මස්කෙළිය.
විෂය - පස් කන්දක් කඩා වැටීමේ අවදානමක් පිළිබඳ වූ ලිපිය.

මෙම ලිපිය පිළිබඳව ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී කේ. රාජ්කුමාර් මැතිතුමා, ගරු මන්ත්‍රී පී. රාජ්කුමාර් මැතිතුමා යන අය අදහස් ඉදිරිපත් කළහ. ඒ සමගම එකී කරුණු සඳහා ගරු සභාපතිතුමිය විසින් පිළිතුරු ලබා දෙන ලදී.

**<u>ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
කොළඹ පිහිටා ඇති ''වෙනස'' නම් ආයතනය මඟින් අපහට ප්ලාස්ටික් අප ද්‍රව්‍ය දැමීම සඳහා අපද්‍රව්‍ය බහාලුම් ලබාදීම වෙනුවෙන් මාගේ ස්තූතිය පුදකර සිටිනවා. එමෙන්ම 2022.07.12 වන

දින හිටපු ජනාධිපතිතුමාහට තිරිඟු පිටි සම්බන්ධව ලිපියක් යොමුකර තිබුණා. මේ වන විට ජනාධිපති කවරෙක්ද යන්න පිළිබඳව ප්‍රශ්නයක් මතුව තිබුණා. ජනාධිපති කාර්යාලයෙන් මේ වනතෙක් මේ සඳහා පිළිතුරක් ලබා දී නැහැ. පක්ෂ, පාට භේදයකින් තොරව කටයුතු කිරීමයි ජනාධිපතිතුමාගේ රාජකාරිය. සභාවේ මන්ත්‍රීවරුන් 16 දෙනාද, තිරිඟුපිටි විකුණනු ලබන මස්කෙළිය නගරයේ වෙළඳ මහතුන්ද අත්සන් කර මහ සභා වාර්තාවටද මෙය ඇතුලත් කර තිබෙනවා. නමුත් මෙතෙක් පිළිතුරක් ලැබී නැහැ. ඒ පිළිබඳව මම කණගාටු වෙනවා. ගරු සභාපතිතුමියනි, මම ඉල්ලා සිටිනවා මෙම ලිපිය නව ජනාධිපති අතිගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙත තැපැල් කරන ලෙස.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මීළඟට මුදල් සහ අනෙකුත් කමිටු වාර්තා සභාවට ඉදිරිපත් කරමු.

**<u>ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මුදල් කමිටු වාර්තාවට අනුව මස්කෙළියේ වෙළඳපොල සහ ගලි යන්ත්‍රය මිලදී ගැනීම පිළිබඳව සාකච්ඡා කර තිබෙනවා. ගලි යන්ත්‍රයක් නොමැතිවීම නිසා මෙම ප්‍රදේශයේ ජනතාව විශාල අපහසුතාවන් වලට මුහුණ දෙමින් සිටිනවා. ඩීසල් ප්‍රශ්නය නිසා වෙනත් ප්‍රදේශවල සිට ගලි යන්ත්‍ර ලබා ගැනීමේදී ජනතාවට වැඩි මුදලක් ගෙවන්න සිදුවී තිබෙනවා. එනිසා මේ කටයුතු කඩිනම් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
ඉතා කඩිනමින් මේ ගැටළු සියල්ල අවසන් කර ගලි යන්ත්‍රයක් ලබා දෙනවා.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මුදල් කමිටු වාර්තාවේ විෂය අංක දෙක යටතේ වතුකරයේ පිහිටි වෙළඳසැල් සඳහා වෙළෙඳ බලපත්‍ර ලබාදීම සම්බන්ධව සඳහන් කර තිබෙනවා. ඒ පිළිබඳව ලබාගෙන ඇති නිර්දේශ පිළිගන්නා අතර මීට පෙර සභාවේ තීරණයක් ලබාගෙන වතුකරයේ පිහිටි වෙළෙඳ සැල් සඳහා ජංගම සේවාවක් සිදුකර වෙළඳ බලපත්‍ර ලබා දෙන ලෙසට අපි ඉල්ලා සිටියා. එක් එක් කොට්ඨාශවල පිහිටි වෙළෙඳසැල් කීයක් සඳහා වෙළෙඳ බල පත්‍ර නිකුත් කර තිබෙනවාද යන තොරතුරු ලබා ගන්නේ නම් එය සුදුසුයි. භාණ්ඩවල මිල වැඩිවීම පිළිබඳව මේ කාලවකවානුව තුළ අපි වැඩියෙන් කතා කරනවා. අපගේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වැඩියෙන් තිබෙන්නේ වතු ප්‍රදේශ. වතු ප්‍රදේශයේ පිහිටි වෙළෙඳ සැල් සඳහා බලපත්‍ර නිකුත් කරන ප්‍රාදේශීය සභාව එම වෙළඳසැල්වල මිල පාලන දර්ශනය ප්‍රසිද්ධියට පත් කළ යුතු බවට පැවසිය යුතුයි. නගරයේ පිහිටි වෙළඳසැල් වලට වඩා වැඩි මිලට වතුකරයේ වෙළඳසැල්වල භාණ්ඩ විකුණනු ලබනවා. ඒ සඳහා වූ තීරණයත් මේ සමග අමුණා යැවීම සුදුසු බවට සඳහන් කරනවා. එමෙන්ම අපි ඔවුන්ට වතු ආශ්‍රිතව ගෑස් විකිණීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද , දැනට ගෑස් මිල අඩු වී තිබුණත් ඔවුන් එය වැඩි මිලට අලෙවි කරනවා. මෙතෙක් වෙළඳ බලපත්‍ර නිකුත් නොකල වෙළඳසැල් වලටද බලපත්‍රය නිකුත් කළ යුතුයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
අපට ඔවුන් වෙත ලිපි නිකුත් කළ හැකියි.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
ගරු සභාපතිතුමියනි, වතුකරය ආශ්‍රිත වෙළඳසැල් සඳහා බලපත්‍ර ලබාදීම පිළිබඳව මුදල් කමිටුවේ සාකච්ඡා කළ කරුණු සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී කේ. සුරේෂ් කුමාර් මැතිතුමා අදහස් කිහිපයක් පළකර සිටියා. මේ දිනවල මස්කෙළිය නගරයෙන් මිලදී ගත් භාණ්ඩ වතු ප්‍රදේශවලට රැගෙන ගොස් ඒ මිලටම විකිණීමේ අවස්ථාවක් ලැබෙන්නෙ නැහැ. දැනටමත් ප්‍රවාහන ගාස්තු ඉතා ඉහළ මට්ටමේ පවතිනවා. ඒ නිසා ප්‍රවාහන ගාස්තු ද ඇතුළත්ව තමයි මිල ගණන් නිර්ණය කළ හැක්කේ. හැටන් සහ මස්කෙළිය නගර අතර මිල ගණන් වෙනසක් දක්නට තිබෙනවා. අපට ආදායමක් ලබාගැනීම සඳහා වෙළඳසැල් සඳහා බලපත්‍ර ලබාදිය හැකියි. නමුත් භාණ්ඩ වල මිළ පාලනය කිරීමේ බලය සභාවට නැහැ. මේ සඳහා මිල පාලන සභාවක් තිබෙනවා. අද පවතින තත්වය හොඳටම දන්නවා. මේනිසා අසාධාරණයට ලක්ව සිටින්නේ වතු ප්‍රදේශවල කුඩා වෙළඳසැල් පවත්වාගෙන යන වෙළඳසැල් හිමියන්.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
අපට මිල පාලනය කරන්න බැහැ නමුත් මිල දර්ශනය ප්‍රදර්ශනය කරන ලෙස පැවසිය හැකියි.

**ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
ගරු සභාපතිතුමියනි, බලපත්‍ර කාරණාව පිළිබඳව පැවසීමේදී එක් වෙළඳසැලක් පවත්වාගෙන යාම සඳහා අනුමැතිය ඉල්ලා සිටින අවස්ථාවේදී නගරයේ සහ වතුකරයේ පිහිටි වෙළඳසැල් අතර විශාල පරස්පරතාවයක් ඇති බවට මා අදහස් කරනවා. මම ගරු මන්ත්‍රීවරයෙක් වශයෙනුයි කථා කරන්නේ. ගරු මන්ත්‍රීතුමාට ස්ථාවර දෙකකින් යුක්තව කථා කළ හැකියි. සෑම ස්ථානයකම නගරයේ තිබෙන මිලටම ගතහැකි නම් එය මම අගය කරනවා.

**ගරු මන්ත්‍රී කේ.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
මිල පාලන අධිකාරියට මේ පිළිබඳව මීට කලින් දැනුම් දුන්න ද මෙතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ලබාගෙන නැහැ. එනිසා මිල පාලන අධිකාරියට නැවතත් ලිපියක් යොමු කරන්න.

**ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා (එ.ජා.ප)**
මෙතෙක් යොමු කළ ලිපි සඳහා කිසිදු පිළිතුරක් ලැබී නැහැ. ප්‍රායෝගික වන ක්‍රියාමාර්ග ලබාගත යුතුයි.

**ගරු මන්ත්‍රී පී.රාජ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)**
වතු ආශ්‍රිත ප්‍රදේශවල භාණ්ඩ විකුණුම් මිල පිළිබඳව විවිධ ගැටලු සම්බන්ධයෙන් විවිධ අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**
වතු ආශ්‍රිත ප්‍රදේශවල ගෑස් මිල සහ භාණ්ඩ වල මිල පිළිබඳව විවිධ අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු මන්ත්‍රී එස්.සුබ්‍රමනියම් මැතිතුමා (එ.ජා.ප)**
ෆුඩ් සිටිවල මිල ගණන් සහ එහි දකින්නට තිබෙන භාෂා ප්‍රශ්නය ද එහි සේවය කරන සේවකයින්ගේ ගැටළු පිළිබඳව ද අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා (ලං.ක.කො)**
භාණ්ඩවල මිල ගණන් පිළිබඳව අදහස් ප්‍රකාශ කරන ලදී.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
භාණ්ඩ සහ ඖෂධ වල මිල වැඩි වීම පිළිබඳව අදහස් ප්‍රකාශ කරන ලදී.

**තීරණ අංක 04**
ඉහත කරුණු සම්බන්ධයෙන් මිල පාලන අධිකාරිය සහ අදාළ අමාත්‍යාංශය වෙත ලිපි යොමු කිරීමට තීරණය කරන ලදී.

**ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා (ලං.ක.කො)**
මුදල් කමිටු වාර්තාව නිවැරදි බවට යෝජනා කරමි.

**ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා (ලං.ක.කො)**
එම යෝජනාව මම ස්ථිර කරමි.

**2022.08.12 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව නිර්දේශයෙන් පසු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.**

**කාරණා අංක 01**
වතු ආශ්‍රිතව වෙළඳ බලපත්‍ර ලබා ගැනීම සම්බන්ධයෙන් මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේදී සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 05**
මේ වන විට ජංගම සේවා ආකාරයෙන් වතු ආශ්‍රිතව වෙළඳ බලපත්‍ර ලබා ගන්නා නමුත් ඒ අතරින් ලබා නොගත් වෙළඳසැල් වලින් බලපත්‍ර ලබා ගැනීමට අදාළ නිලධාරීන්ට අවශ්‍ය උපදෙස් ලබා දීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 02**
මස්කෙළිය නගරයේ අළුතින් ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණය හා මස්කෙළිය ප්‍රාදේශීය සභාවට මිලදී ගැනීමට යෝජිත ගලි බවුසරය සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී.

**තීරණ අංක 06**

- ඉදිකිරීමට යෝජිත නව වෙළඳ සංකීර්ණයේ කටයුතු වලින් මේ වන විට 70%ක් පමණ කටයුතු නිම කර ඇති අතර ගොඩනැගිලි සැලැස්ම නිර්මාණය කිරීමට කඩිනම් පියවර ගැනීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී.
- ගලි බවුසරය මිලදී ගැනීම සම්බන්ධයෙන් වන බැංකු ණය කඩිනමින් ඉල්ලුම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට මුදල් කමිටුව නිර්දේශ කරන ලදී.

ඉහත කරුණු සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 03**
ZB – 0394 අංක දරණ කම්පැක්ටර් රථයේ අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් වන ලිපිය කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

| |
|---|
| **තීරණ අංක 07**<br>ZB – 0394 කම්පැකටර් රථයේ අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් මීට පෙර තාක්ෂණික කමිටුව වෙත ඉදිරිපත් කර නිර්දේශය ලබාගෙන ඇති බැවින් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී. |

**කාරණා අංක 04**
පසුගිය මුදල් කමිටුවට ඉදිරිපත් කල මස්කෙළිය ආයුර්වේද මධ්‍යස්ථානයේ අළුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් වන ඇස්තමේන්තුව කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

| |
|---|
| **තීරණ අංක 08**<br>ඇස්තමේන්තුව අනුව අදාළ අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී.<br>( 16459.00). මෙය සභාව විසින් අනුමත කරන ලදී. |

**කාරණා අංක 05**
රිකාටන් කසළ කළමනාකරණ මධ්‍යස්ථානයේ වහළ අබලන් වී ඇති බව දන්වමින් ලිපියක් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

| |
|---|
| **තීරණ අංක 09**<br>ඒ සම්බන්ධයෙන් පරික්ෂා කර බලා වහළ සකස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී. |

**කාරණා අංක 06**
රිකාටන් කසළ කලමනාකරණ මධ්‍යස්ථානයේ ඇති කොම්පොස්ට් හලන යන්ත්‍රයේ නෙට් එක පළුදු වී ඇති බව දන්වමින් කමිටුව වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී.

| |
|---|
| **තීරණ අංක 10**<br>ඉහත කරුණ සම්බන්ධයෙන් තාක්ෂණ නිලධාරීතුමා විසින් පරික්ෂා කර බලා නෙට් එක මාරු කිරීමට අවශ්‍ය කටයුතු කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී. |

**කාරණා අංක 07**
කොවිඩ් වසංගතය පැවති සමයේ විෂබීජහරණ කටයුතු සදහා යොදාගත් බෙහෙත් ඉසින යන්ත්‍ර අබලන් වී ඇති අතර එම අළුත්වැඩියා කටයුතු සදහා වන වියදම දන්වමින් කමිටුව වෙත ලිපියක් ඉදිරිපත් කරන ලදී.

| |
|---|
| **තීරණ අංක 11**<br>ඒ අනුව මේ සදහා වැඩි මුදලක් වැය වන බැවින් වෙනත් ස්ථාන වලින්ද මිල ගණන් ලබා ගෙන අවම මිලක් ලැබෙන ස්ථානයෙන් මෙම අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී. |

**කාරණා අංක 08**
මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික සේවය සඳහා අවශ්‍ය වන උපකරණ සම්බන්ධයෙන් ලිපියක් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 12**
මේ සදහා ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මෙම උපකරණ ගෙන්වා ගැනීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 09**
**RA – 9713** අංක දරණ ට්‍රැක්ටර් රථය හා **252 – 6523** අංක දරණ කැබ් රථය අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් වන ලිපිය කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 13**
මේ සම්බන්ධයෙන් තාක්ෂණික කමිටුව නිර්දේශය පරිදි කටයුතු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 10**
විදුලිය අරපිරිමැස්මෙන් භාවිතය සදහා හදුන්වාදෙන Auto On – Off Switch සම්බන්ධයෙන් Maribo යන ආයතනය විසින් ලැබුණු ලිපිය කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 14**
මෙම උපකරණයෙන් පළමුව 03ක් මිලදී ගෙන මෙම කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 11**
රිකාටන් කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සදහා අවශ්‍ය හෝස් සදහා ලැබුණු මිල ගණන් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

| Shop Name | Amount |
|---|---|
| Mahadev | 7650.00 |
| Sri Ambals | 7200.00 |
| P.T.P. & Sons | 7800.00 |
| Natharsha Hardware | 7680.00 |

**තීරණ අංක 15**
උසස් තත්වයේ හා අවම මිල ගණන් ඉදිරිපත් කල Sri Ambals ආයතනයෙන් මෙම මිලදී ගැනීම් සිදු කිරීමට කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**කාරණා අංක 12**
අප ප්‍රාදේශීය සභාව වෙත පුහුණු කටයුතු සඳහා නිලධාරීන්ට පුහුණු දීමනා ගෙවීම සම්බන්ධව මුදල් කමිටුවට සාකච්චා කරන ලදි.

**තීරණ අංක 16**
ඉහත කරුණු සම්බන්ධව පුහුණුලාභින්ට රු.3000 ක් දීමනා ගෙවීමටත් පුහුණුලාභින්ගේ සංඛ්‍යාව 3 කට සීමා කිරීමටත් කමිටුව නිර්දේශ කරන ලදී. මෙය සභාව විසින් අනුමත කරන ලදී.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මීළඟට ගරු මන්ත්‍රී එස්. සුරේෂ් කුමාර් මැතිතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන ලෙසට ඉල්ලා සිටිමි.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
මාගේ පළමුවැනි යෝජනාව වනුයේ, පසුගිය සති දෙකකට පෙර මාගේ කොට්ඨාශයට සහ ශීතගඟුල කොට්ඨාශයට ජංගම සේවාවක් සංවිධානය කර ඇති බව දැනුම් දී තිබුණා. නමුත් අයහපත් කාලගුණය හේතුවෙන් එය කල් දමා තිබෙනවා. එදින කාලගුණය ඉතා වැදගත් කාරණයක්. ජනතාවගේ අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ඒ සඳහා වැදගත් තැනක් ලබාදෙමින්, එය ප්‍රතික්ෂේප කරන බ ව පවසමින්, එය කල්දමන බව ප්‍රකාශ කරල තිබෙනවා. මරේ ප්‍රදේශයේ පමණක් ඡන්දදායකයින් 2500 ක් සිටිනවා. 5000 කට වැඩි ප්‍රමාණයක් එහි සිටිනවා. 200 කට වැඩි ප්‍රමාණයක් උප්පැන්න, මරණ සහතික සහ ජාතික හැඳුනුම්පත් ප්‍රශ්න ඇති පිරිසක් සිටිනවා. එම ප්‍රදේශයේ මෙම ජංගම සේවාව පැවැත්වුවහොත් ඉතාමත් පහසු වේවි. එදින මම සහ ගරු මන්ත්‍රී කේ. නිත්‍යානන්දන් මැතිතුමා ගොස් ග්‍රාම නිලධාරී මහතා හමුවී සාකච්ඡා කළ අවස්ථාවේදී මස්කෙළිය ප්‍රදේශයේ පැවති ජංගම සේවාව සඳහා ඉතාමත් අඩු ප්‍රමාණයක් සහභාගී වූ බවට අදහස් ප්‍රකාශ කළා. එනිසා අපේ ප්‍රදේශයට පැමිණ සහභාගි වෙයිද කියන සැකයක් මතුකර තිබුණා. මස්කෙළිය ප්‍රදේශයේ සිටින අයට අවශ්‍යතාවය අඩු වෙන්න ඉඩ තිබෙනවා. මරේ ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි කොට්ඨාශ දෙකක් තිබෙනවා. එහි අවශ්‍යතා තිබෙන අය වැඩියෙන් සිටිනවා. ශීතගඟුල ප්‍රදේශයේ 300 ක් සිටිනවා. එබැවින් මෙහි ජංගම සේවාවන් පැවැත්වීමට කටයුතු කරන ලෙසට නැවත සභාව මගින් ඉල්ලීමක් කර අඹගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත ලිපියක් යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
දැනට රටතුල පවතින ඉන්ධන අර්බුදය වැනි කාරණා නිසා එම කාර්යයන් නවත්වා තිබෙනවා. අපි නැවත ඉල්ලා සිටිමු.

**තීරණ අංක 17**
ජංගම සේවා පැවැත්වීම සම්බන්ධයෙන් අඹගමුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙත ලිපියක් යොමු කිරීමට තීරණය කරන ලදී.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
මාගේ දෙවන යෝජනාව වන්නේ, මරේ කොට්ඨාශය ග්‍රාම නිලධාරී වසම් දෙකකට වෙන් කිරීම සම්බන්ධවයි. මාස හයකට පසුව තවදුරටත් මෙම යෝජනාව නැවත ඉදිරිපත් කරමි.

**ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)**
මෙම කරුණ පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන කමිටු රැස්වීමේදී සාකච්ඡා කර තිබෙනවා.

**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**
සභාව මගිනුත් මේ සඳහා ඉල්ලීමක් යොමු කළොත් ප්‍රයෝජනවත් වේවි. ග්‍රාම සේවා නිලධාරීවරයෙක් නොමැති බව මම දන්නවා. නමුත් මරේ වශයෙන් තනි ග්‍රාම

නිලධාරිවරයෙක් පත් කළොත් ප්‍රයෝජනවත් වේවි. දැනට සිටින ග්‍රාම නිලධාරිවරයා මරේ ප්‍රදේශයට විශාල සේවාවක් කළ හැකි නිලධාරීවරයෙක්. නමුත් ඔහු ශීතගඟුල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වරයෙක්. සමෘද්ධි සංවර්ධන නිලධාරිවරයෙක් සිටිනවා. ඔහුත් එලෙසමයි. මම මේ යෝජනාව ඉදිරිපත් කිරීමට හේතුව වූයේ, මෑතකදී සිදු වූ යම් යම් සිදුවීම් නිසයි. මුහුණු පොතේ සිට සියලුම දේවල් සිදුවුණා. උදවු ලැබුණා. මාගේ කොට්ඨාශයේ පාසල් පහක් පමණක් තිබෙනවා. පාසල් සිසුන් සඳහා ශ්‍රී ලංකා රතු කුරුස සංගමයෙන් බොහෝ උදවු ලැබුණා. මෙම භාණ්ඩ ජලාශයට මෙහා තිබෙන පාසල් වලට පමණයි ලැබුණේ. අනෙක් ප්‍රදේශයේ සිටින අය ගැන සැලකිලිමත් වුණේ නැහැ. ඊට හේතුව එය නල්ලතන්නි ප්‍රදේශය නිසා එහි ගැටළු නැති බවට හේතු සාධක වුණා. ග්‍රාම නිලධාරී මහතාද උත්සාහ කළා. නමුත් ඉන් යහපත් ප්‍රතිඵලයක් ලැබුණේ නැහැ. එම ප්‍රදේශයේද දුප්පත් සිසුන් සිටිනවා. එහි එක ග්‍රාමනිලධාරී කොට්ඨශයක් නේද තිබෙන්නේ. එහි ගොස් ලබා දෙන්න අවශ්‍ය නැති තත්වයක් උදා උණා. එකම ග්‍රාම නිලධාරී කොට්ඨාශයකට මෙතරම් භාණ්ඩ ලබාදිය යුතුද කියන මානසික තත්වයක් ඇති වුණා. මෙයයි ප්‍රශ්නය. මේ නිසා ග්‍රාම නිලධාරී කොට්ඨාශ දෙකක් තිබෙන බවට හේතු ගැන්වීම සඳහා ද, මරේ කොට්ඨාශයේ වතු අටක් තිබෙනවා. මෙම වතු අටෙහිම විශාල ජනගහනයක් සිටිනවා. එහි ග්‍රාම නිලධාරී කොට්ඨාශ දෙකක් තිබෙනවා නම් ජනතාව වැඩි ප්‍රයෝජනයක් ලබා ගනීවි. හිටපු මධ්‍යම පළාත් සභා මන්ත්‍රී ගරු පිලිප් මැතිතුමාටත් මේ පිළිබඳව කරුණු ඉදිරිපත් කර මේ සඳහා නිවැරදි ක්‍රියාමාර්ගයක් ගන්නේ නම් මරේ ප්‍රදේශය වසම් දෙකකට වෙන් කිරීමට වැඩි අවස්ථාවක් තිබෙන බවට ප්‍රකාශ කරමින් මෙම යෝජනාවට අනුව අදාළ ලිපි යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**

ගරු මන්ත්‍රී එස්. සුරේෂ්කුමාර් මැතිතුමාගේ යෝජනාව ස්ථිර කළ අතර එකී යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අදහස් ප්‍රකාශ කළහ.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී පි.ආනන්දන් මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා ද අදහස් ඉදිරිපත් කරන ලදී.

**තීරණ අංක 18**

ඉහත කී යෝජනාවට අනුව මරේ සහ බ්‍රවුන්ස්වික් කොට්ඨාශ, ග්‍රාමසේවක වසම් දෙකක් වශයෙන් සංශෝධනය කිරීම සඳහා අදාල ස්ථාන සඳහා ලිපි යොමු කිරීමට තීරණය කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**

මාගේ මීළඟ යෝජනාව වන්නේ, දිස්ත්‍රික් මූලික රෝහල් සහ ගම්මාන වල පිහිටා ඇති බෙහෙත් ශාලා හේතුවෙන් ජනතාව මුහුණ දෙන ගැටළු පිළිබඳවයි. අද පවතින තත්වය නිසා ජනතාව බොහෝ ගැටළු වලට මුහුණ දෙනවා. ඉන් එක ගැටලුවක් නම් වෛද්‍ය අංශයේත් විශාල ගැටළුවක් තිබෙනවා. බෙහෙත් ශාලාව වලට අවශ්‍ය ඖෂධ නියමිත ආකාරයෙන් ලැබෙන්නේ නැහැ. ඖෂධ නැහැ. මේ නිසා බෙහෙත් ශාලා මගින් සේවය කරන, රෝගීන් සඳහා උපස්ථාන කටයුතු අඩුවී යන බව මාගේ පළමුවන අදහසයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල රටේ ආර්ථිකය පිළිබඳව වැදගත් සංධිස්ථානයක් වෙනවා. රාජ්‍ය සේවකයින් අඩු කළ යුතු බව ඔවුන්ගේ ප්‍රධාන අදහසයි. ග්ලැන්කන් රෝහලේ රෝගියකු ඇතුලත් කල විට, රෝගියාට

ඇවිදීමේ අපහසුතාවයක් ඇත්නම් ඔහු ඇතුළත් කළ අවස්ථාවේ සිට ඔහු ලඟින් කවුරුන්ද සිටිය යුත්තේ? ඔහුගේ උපස්ථාන කටයුතු සඳහා නිවසින් කවුරෙකු හෝ සිටිය යුතු බව රෝහලේ යෝජනාවයි. එසේනම් රෝහල්වල සුදු සහ නිල් පාට ඇඳුම් වලින් සැරසී සිටින සුළු සේවකයින් කවුද කියන එකයි ප්‍රශ්නය. ඔවුන්ගේ සේවාව කුමක්ද? මෙය විශාල ප්‍රශ්නයක් බවට පත්ව තිබෙනවා. රෝහල් වල සුළු සේවකයින් පත්කිරීමේ ප්‍රධාන හේතුව රෝහල් ගතවන රෝගීන්ට උපස්ථාන කටයුතු සිදු සිදුකිරීමයි. රෝගීන්ව රෝද පුටුවල වාඩි කරවා රැගෙන ගොස් ඇඳට දාන එක පමණක් ඔහුන්ගේ රාජකාරිය නොවෙයි. ග්ලැන්කන් රෝහලේ අති විශාල සුළු සේවකයින් සංඛ්‍යාවක් සිටිනවා. නමුත් රෝගීන්ට උපස්ථාන කිරීම සඳහා නිවැසියෙක් යා යුතුව තිබෙනවා. රෝගීන්ට උපස්ථාන කටයුතු කිරීමට යන අය තමයි වැඩි වශයෙන් රෝගීන් බවට පත් වෙන්නේ. හේතුව ඔවුන්ට එහිදී නවාතැන් ගැනීමේ පහසුකම් ඉතාමත් අඩුයි. එනිසා මේ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගන්නා ලෙසට අදාල ආණ්ඩුකාරතුමා වෙත ලිපි යොමු කරන්න. සුළු සේවකයින්ගේ සේවාව ඉතාමත් අඩුයි. වතු ආශ්‍රිතව පිහිටා ඇති බෙහෙත් ශාලාවල සේවාවද මෙලෙසමයි. එහි සේවය කරන වතු වෛද්‍ය අධිකාරී දිනපතා එක් එක් වතුවලට ගොස් එහි සිටින රෝගීන් පරීක්ෂා කළ යුතුයි. එයයි ඔහුගේ සේවය. මරේ වත්තේ සිදුවෙන්නේ, වෛද්‍යවරයාව දුරකථනයෙන් සම්බන්ධ කර පැමිණ රෝගියාව පරික්ෂා කරන්න කියා සිටියත් මස්කෙළිය රෝහලට රැගෙන යන ලෙසට වතු වෛද්‍ය නිලධාරි පවසයි. පැමිණ රෝගියාව පරීක්ෂා කරන්න කලින් මස්කෙළිය රෝහලට රැගෙන යන ලෙස පවසනවා. මරේ වත්තේ සිට මස්කෙළිය රෝහලට රෝගීයා රැගෙනයාම සඳහා ත්‍රිරෝද රථයකට රුපියල් 3500.00 ක් ඉල්ලනවා. සේවාව කෙතරම් දුරට පවතිනවා ද කියන එක විශාල ගැටළුවක්. සවස් වරුවේ රුපියල් 750.00 ක් 800.00 ක් වැනි ලාභයකට බෙහෙත් ලබා දෙනවා. වතු වලට ලැබෙන ඖෂධ විකුණනු ලබනවා. එනිසා මේ සඳහා ද ක්‍රියාමාර්ග ගන්නා ලෙසට ඉල්ලා සිටිනවා. මීළඟට මස්කෙළිය දිස්ත්‍රික් මූලික රෝහල පිළිබඳව කතා කරන විට එය 2000 වර්ෂයට පෙර ඉතා හොඳ තත්වයක පැවතුණා. ගරු මන්ත්‍රීවරුන් වැඩි දෙනෙක් මෙවැනි අදහසක් ඉදිරිපත් කර තිබුණා. මස්කෙළිය රෝහල නැවතත් ක්‍රියාත්මක තත්වයට පත් කළොත් ග්ලැන්කන් රෝහලට රෝගීන් යොමු කිරීමේ ප්‍රවණතාවය අඩු වෙනවා. කොවිඩ් කාලයේ දී මස්කෙළිය රෝහල හොඳ තත්වයකට අළුත්වැඩියා කර තිබෙනවා. රෝගීන් විශ්වාසයෙන් යුතුව පැමිණීමේ තත්වයක් උදා කළ යුතුයි. ජනතාව මස්කෙළිය රෝහල වෙත පැමිණීමට බිය වෙනවා. ඒ වගේම දැන් ග්ලැන්කන් රෝහල වෙත යන්නත් බිය වෙනවා. මරේ ප්‍රදේශයේ පුද්ගලයෙක්ව අසනීපය හේතුවෙන් රෝහලට ඇතුලත් කර තිබෙනවා. ඔහුගේ උපස්ථාන කටයුතු සඳහා නිවසේ සිට කවුරුත් නොපැමිණීම නිසා එම රෝගියාට විධිමත්ව ප්‍රතිකාර කර නැහැ. ඔහුට බැණ තිබෙනවා. රෝගීන්ට උපස්ථාන කිරීම සඳහා තමයි ඔවුන්ට වැටුප් ගෙවන්නේ. මේ පිළිබඳව අදාල සෞඛ්‍ය අමාත්‍යාංශයට සහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති වශයෙන් කටයුතු කළ ගරු රාමේෂ්වරන් මැතිතුමාට ද දැනුම් දෙන්න. හිටපු ගරු අමාත්‍ය ජීවන් තොණ්ඩමන් මැතිතුමාට ද මේ පිළිබඳව ලිපියක් යොමුකරන ලෙස ඉල්ලා සිටිමි.

එකී යෝජනාව පිළිබඳව ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

ඉහත දක්වන ලද යෝජනාව පිළිබඳව ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා විසින් එතුමාගේ අදහස් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ඒ.රවීන්ද්‍රරාජා මැතිතුමා ද අදහස් ප්‍රකාශ කරන ලදී.

ඉහත දක්වන ලද යෝජනාව පිළිබඳව ගරු මන්ත්‍රී කේ.සුරේෂ්කුමාර් මැතිතුමා ද එතුමාගේ අදහස් දක්වන ලදී.
එම යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී කේ.යෝගේන්ද්‍රන් මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

**තීරණ අංක 19**
ගරු මන්ත්‍රී එස්. සුරේෂ් කුමාර් මැතිතුමාගේ සෞඛ්‍ය සුළු සේවකයින් පිළිබද කාරණාව සම්බන්ධයෙන් ගරු ආණ්ඩුකාරතුමා, දිස්ත්‍රික් ලේකම්තුමා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ජීවන් තොණ්ඩමන් මැතිතුමා සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී රාමේෂ්වරන් මැතිතුමා වෙත ලිපි යොමු කිරීමට තීරණය කරන ලදී.

**තීරණ අංක 20**
වතු වෛද්‍ය නිලධාරී පිළිබඳ කාරණාව සම්බන්ධයෙන් ට්‍රස්ට් ආයතනය වෙත ලිපි යොමු කිරීමට තීරණය කරන ලදී.

**තීරණ අංක 21**
ගරු සභාපතිතුමිය, ගරු මන්ත්‍රීවරුන්, ඇතුළුව ප්‍රාදේශීය ලේකම්, වතු වෛද්‍ය නිලධාරීවරුන්, හදිසි මරණ පරීක්ෂක, දිස්ත්‍රික් වෛද්‍ය නිලධාරී, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී, මහජන සෞඛ්‍ය පරීක්ෂක වැනි නිළධාරීන් සම්බන්ධ කරගනිමින් මස්කෙළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාළ ඇතැම් කරුණු සම්බන්ධයෙන් සාකච්ඡාවක් සංවිධානය කිරීමට තීරණය කරන ලදී.

<u>**ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)**</u>
මාගේ මීළඟ යෝජනාව වන්නේ විවිධ සේවා සමූපකාර සමිතිය පිළිබඳවයි. මරේ කොට්ටාශයේ පසුගිය කාලයේ පවත්වාගෙන ගිය විවිධ සේවා සමූපකාර සමිතියට අයත් ගොඩනැගිල්ලක් එම ප්‍රදේශයේ තිබුණා. මේ පිළිබඳව අවුරුද්දකට පෙර මෙම සභාවේ දී මම සදහන් කර තිබෙනවා. විවිධ සේවා සමූපකාර සමිතියට අයත් බිම් කොටසක් මරේ ප්‍රදේශයේ පෙර සිටම තිබෙනවා. දැන් එය පෞද්ගලිකව පුද්ගලයෙකු හිමිකම් කියමින් නිවසක් වශයෙන් භාවිතා කරනවා. එම ගොඩනැගිල්ලේ විවිධ සේවා සමූපකාර සමිති වෙළෙඳ සැලක් පවත්වාගෙන ගියා නම් දැනට රටේ පවතින අසාමාන්‍ය තත්වය මත මරේ ප්‍රදේශයේ ගැටළුවලට විසඳුම් ලබා ගන්න තිබුණා යන එක මගේ අදහසයි. සමූපකාර සමිති වෙළඳසැල මගින් අඩු මිලට ජනතාවට භාණ්ඩ ලබා දෙන්න තිබුණා. නමුත් එම ඉඩම දැනට තනි පුද්ගලයෙකුට අයිතිව තිබෙනවා. දැන් එම ගොඩනැගිල්ලට ඔහු විදුලි සම්බන්ධතාවයත් ලබා ගෙන තිබෙනවා. කාට කාට ද කොයි ඉඩම ද අයිති වී තිබෙන්නේ කියා අපි දන්නේ නැහැ. එම ඉඩම ඇත්තටම වත්තට අයත් ද නැතිනම් විවිධ සේවා සමුපකාර සමිතියට අයත්ද කියන එක මටත් සැකයි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
වත්තට අයත් ගොඩනැගිල්ල තමයි විවිධ සේවා සමූපකාර සමිතියට ලබාදී තිබෙන්නේ.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
එසේ නම් තනි පුද්ගලයෙකුට කොහොමද ගොඩනැගිල්ල ලබා දෙන්නේ? නිවසක් නොමැති කෙනෙකුට ලබා දී තිබුණා නම් කමක් නැහැ. නමුත් ඔහුට නිවසක් තිබෙනවා. එනිසා මේ පිළිබඳව තොරතුරු සභාව මගින් ඉදිරිපත් කරන්නේ නම් සුදුසුයි. විවිධ සේවා සමූපකාර සමිති වෙළඳසැලක් මරේ ප්‍රදේශයේ තිබෙනවා නම් එහි ජීවත් වෙන ජනතාවට ප්‍රයෝජනවත් වේවි. අදාල ස්ථාන වෙත ලිපි යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

එම යෝජනාව පිළිබඳව ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා තුමාගේ අදහස් ප්‍රකාශ කරන ලදී.

එම යෝජනාව සම්බන්ධව ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා ද එතුමාගේ අදහස් ප්‍රකාශ කරන ලදී.

**තීරණ අංක 22**
ගරු මන්ත්‍රී එස්. සුරේෂ්කුමාර් මැතිතුමාගේ මරේ ප්‍රදේශයේ විවිධ සේවා සමූපකාර සමිති වෙළඳසැල පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල පිළිබඳව වතු කළමනාකරු වෙත ලිපි යොමු කිරීමට තීරණය කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
මාගේ මීළඟ යෝජනාව වන්නේ, ශීතගඟුල කොට්ඨාශයේ මුල්ගම හංදියේ පිහිටි ත්‍රිරෝද රථ ගාල පිළිබඳවයි. ත්‍රීරෝද රථ ගලේ පවතින ගැටළු පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමට අදහස් කරමි. කොරෝනාවෙන් පසුව ඔවුන්ගේ ජීවනෝපාය මාර්ගය විශාල ගැටළුවක් වී තිබෙනවා. තමන් සිටින බව තහවුරු කිරීම සඳහා, ප්‍රාදේශීය සභාවෙන් අනුමැතිය ලබා දී නොමැති බව මම ප්‍රකාශ කරන්නේ එම ත්‍රීරෝද රථ ගාලෙයි. එහි සිටින ත්‍රිරෝද රථ රියදුරන් ලියාපදිංචි කරන ලෙසයි මම ඉල්ලා සිටියේ.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
මේ පිළිබඳව අපි පරීක්ෂාකළ අවස්ථාවේ, එක් අයෙක් කෝවිලේ බැංකු ගිණුමට මුදල් ගෙවා ඇති බවට ගැටළුවක් තිබෙනවා. ඒ පිළිබඳව ද සොයා බලන්න.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
ලියාපදිංචිය පමණක් ආරම්භ කරන්න. ඒ අවස්ථාවේදී අනෙකුත් ගැටළු නිරාකරණය කළ හැකියි. විශාල ගැටළුවක් එහි ඇතිවීමේ අවස්ථාව ද අඩු වෙනවා. ඉන්ධන ගැටළුව මතු වූ අවස්ථාවේ එක්තරා පුද්ගලයෙක් කෙටි දුරකට වැඩි මුදලක් අය කරගෙන තිබෙනවා. කොළඹට යාම සඳහා රුපියල් 30000.00 ක් ලබාගෙන තිබෙනවා. මෙම ත්‍රිරෝද රථය රථ ගාලේ ඇති රථයක් නොවෙයි. ඔබතුමියට අවශ්‍ය නම් ත්‍රිරෝද රථ සභාපතිවරුන් ගෙන්වා කතා කළොත් ඔවුන් සියළුම තොරතුරු ඉදිරිපත් කරාවි.

ඉහත යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී කේ.නිත්‍යානන්දන් මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

එකී යෝජනාව පිළිබඳව ගරු මන්ත්‍රී පී.ආනන්දරාජ් මැතිතුමා ද අදහස් දක්වන ලදී.

එම යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ඒ.රවින්ද්‍රරාජා මැතිතුමා විසින් ද අදහස් ප්‍රකාශ කරන ලදී.
ඉහත දැක්වූ යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී ටී.වසන්තකුමාර් මැතිතුමා විසින් අදහස් ප්‍රකාශ කරන ලදී.

**තීරණ අංක 23**
ත්‍රී රෝද රථ ගාල සම්බන්ධයෙන් සොයා බැලීමටත් මස්කෙළිය වෑන් රථ ගාල හා මහජනතාව භාවිතා කරනු ලබන මාර්ගය නිසි ආකාරයෙන් වෙන්කර ලකුණු කිරීමටද තීරණය කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (එ.ජා.ප)</u>**
මාගේ මීළඟ යෝජනාව වන්නේ, වන්දනා සමයේදී පමණක් මුල්ගම හන්දියේ සවිකර ඇති වීථි ලාම්පුව භාවිතා කරන්නේ නම් සුදුසුයි කියන අදහස මෙම සභාවට මම ඉදිරිපත් කර තිබුණා. දැනට පවතින අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් මාගේ යෝජනාව ඉදිරිපත් කරමි. වීථි ලාම්පු නොමැති වීම හේතුවෙන් මිනිසුන්ව අතරමග බස්සවා යනවා. බඩුමුට්ටු ඔසවාගෙන නාය ගිය ස්ථානයේ සිට මිනිසුන් පයින් යනවා. එතන එළිය ප්‍රශ්නයක් බවට පත්ව තිබෙනවා. තාවකාලිකව හෝ එම ස්ථානයේ වීථි ලාම්පු සවිකිරීමට කටයුතු කරන ලෙසට ඉල්ලා සිටිමි. තවද මාගේ කොට්ඨාශයේ ඉතාමත් අනතුරුදායක ලෙස විදුලි කණුවක් තිබෙනවා. එම විදුලි කණුව වැටුණහොත් විශාල හානියක් සිදු වේවි. එවැනි විදුලි කණු වතු ආශ්‍රිත ප්‍රදේශවල බොහොමයක් තිබෙනවා. එනිසා විදුලිබල මණ්ඩලය වෙත මේ පිළිබඳව දැනුම් දී කොන්ක්‍රීට් කණු සවි කළොත් සුදුසු වේවි. එමෙන්ම මුල් කාලයේ සභාව මගින් සවිකල වීථි ලාම්පු අළුත්වැඩියා කිරීමේ කටයුතුද සිදු කර දෙන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිතුමිය (ලං.ක.කො)</u>**
ඒ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී එස්.සුරේෂ්කුමාර් මැතිතුමා (ලං.ක.කො)</u>**
එම අළුත්වැඩියා කටයුතු සිදුකරන නිලධාරියාට ප්‍රවාහන අපහසුතා තිබේනම් මම ඔහුව එක්ක යන්නම්. මාගේ කොට්ටාශයේ තිබෙන එම වීථි ලාම්පු සියල්ල කෙසේ හෝ අළුත් වැඩියා කර දෙන්න. ඒ සමඟම සෙන්ට්‍රල් ජුවලර්ස් එකට යාබදව සවි කර ඇති විදුලි බල්බය පිළිබඳවද අවධානය යොමු කරන්න.

**තීරණ අංක 24**
එකී කාරණාව සම්බන්ධයෙන් ලංකා විදුලිබල මණ්ඩලයට දැනුම්දීමක් සිදු කිරීමට සහ සභාව මගින් සවිකර ඇති වීථි ලාම්පු සියල්ල අළුත් වැඩියා කර දීමටද තීරණය කරන ලදී.

**<u>ගරු සභාපතිනි ජී.සෙන්බගවල්ලී මැතිනිය (ලං.ක.කො)</u>**

මේ සමඟ අද දින මෙම සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහයෝගය ලබාදීම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් මෙයින් සභාවේ වැඩ කටයුතු අවසන් කර සිටිමි.

ස්තූතියි.
ආයුබෝවන්.

සභාපති,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.

ලේකම්,
මස්කෙළිය ප්‍රාදේශීය සභාව,
මස්කෙළිය.